**විශේෂ සටහන 4**

## වෙළෙඳපොළ හැසිරීම අධීක්ෂණය: මූල්‍ය පද්ධතියේ විශ්වාසය පවත්වා ගැනීම


### හැඳින්වීම

පසුගිය දශක දෙකක පමණ කාලය තුළ විධිමත් නියාමනයන් සහිත දියුණු ආර්ථිකයන් තුළ පවා සිදු වූ මූල්‍ය බිඳවැටීම් සහ මූල්‍ය අර්බුද හමුවේ මූල්‍ය ආයතන, මූල්‍ය අධිකාරීන් සහ සමස්තයක් ලෙස මූල්‍ය පද්ධතිය කෙරෙහි මහජනතාවගේ, විශේෂයෙන් ම මූල්‍ය පාරිභෝගිකයන්ගේ විශ්වාසය සහ පැහැදීම පවත්වා ගැනීම ඉතාමත් වැදගත් වන බව මනා ලෙස පෙන්නුම් කර ඇත. මෙම තත්ත්වය තුළ මූල්‍ය අන්තර්ගතභාවය වර්ධනය කිරීම සහ මූල්‍ය සේවා සපයන්නන් විසින් සලසා ඇති මූල්‍ය පාරිභෝගික ආරක්ෂාව ශක්තිමත් කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් මූල්‍ය පද්ධති සුපරීක්ෂණ කාර්යයේ විෂය පථය මෙන්ම ඒ සඳහා වන ප්‍රවේශයන් වඩාත් ශක්තිමත් කිරීමට සහ හැඩගස්වා ගැනීමට ලෝකයේ සෑම මූල්‍ය අධිකාරියක් ම යොමු විය. ඒ අනුව, මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුව, ඵලදායී නියාමනයන්, හැසිරීම් අධීක්ෂණය සහ පාරිභෝගික සවිබල ගැන්වීම මගින් ශක්තිමත් කිරීම ලොව පුරා මූල්‍ය අධිකාරීන්ගේ ප්‍රමුඛතාවයක් බවට පත්වෙමින් ඇත. නිදසුනක් ලෙස, ලෝක බැංකුව විසින් පවත්වන ලද 2022 ගෝලීය මූල්‍ය අන්තර්ගතභාවය සහ පාරිභෝගික ආරක්ෂණය පිළිබඳ සමීක්ෂණයට අනුව, එයට ප්‍රතිචාර දැක්වූ රටවල් 113ක් අතරින් රටවල් 109ක මූල්‍ය පාරිභෝගික ආරක්ෂාව පිළිබඳ රෙගුලාසි ක්‍රියාත්මක වන බව වාර්තා කර ඇත.

### වෙළෙඳපොළ හැසිරීම අධීක්ෂණය

මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වයට සහ ආර්ථික වර්ධනයට දායක වෙමින්, වෙළෙඳපොළ සුපිලිපන්නභාවය සහ තැන්පත්කරුවන්, ණය ගැණුම්කරුවන්, ආයෝජකයන් යන පාර්ශවකරුවන් මෙන්ම මහජනතාව අතර විශ්වාසය පිළිබඳ පුළුල් අරමුණ සාක්ෂාත් කර ගැනීම මගින් නියාමකයින් විසින් මූල්‍ය පාරිභෝගික ආරක්ෂණයේ මූලිකාංගයක් වන මෙම වෙළෙඳපොළ හැසිරීම අධීක්ෂණය භාවිත කරනු ලබයි. පුළුල් හෝ පූර්ණ විෂය පථයක් සහිත වෙළෙඳපොළ හැසිරීම අධීක්ෂණය මගින් මූල්‍ය සේවා සපයන්නන්ගේ නිෂ්පාදන, සේවා, පද්ධති සහ ක්‍රියා පටිපාටි පිළිබඳ අඛණ්ඩ සමාලෝචනයක් සිදුවන අතර එමගින් කඩිනම් නිවැරදි කිරීම් සහ බලාත්මක කිරීම් ක්‍රියාවට නංවනු ලැබේ. වෙළෙඳපොළ හැසිරීම අධීක්ෂණය, මූල්‍ය ආයතන විචක්ෂණශීලී අධීක්ෂණය සමග සසඳා බලන විට, අරමුණු, ප්‍රවේශය, ක්‍රියාවලිය සම්බන්ධයෙන් යම් සමානකම් පැවතුණ ද, එහි සංකල්ප සහ අවධානය යොමු කරන ක්ෂේත්‍ර අනුව විචක්ෂණශීලී අධීක්ෂණයට වඩා වෙනස් වන අතර, එමගින් මූල්‍ය පාරිභෝගිකයින් සහ මූල්‍ය සේවා සපයන්නන් යන දෙඅංශයට ම වඩාත් සාධාරණ වූ තත්ත්වයක් ලබා දීමට කටයුතු කරනු ඇත.

**රූප සටහන වි.ස. 2.1** වෙළෙඳපොළ හැසිරීම අධීක්ෂණ ක්‍රියාවලිය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### වෙළෙඳපොළ හැසිරීම අධීක්ෂණ ප්‍රවේශයන්

විවිධ මෙහෙයුම් පරිසරයන් සහ ව්‍යුහයන් යටතේ වෙළෙඳපොළ හැසිරීම අධීක්ෂණය සැලසුම් කර ක්‍රියාත්මක වන බැවින්, නියාමන අරමුණු, සම්පත් සහ කුසලතා මට්ටම් මෙන්ම මූල්‍ය අංශයේ සහ සමස්ත ආර්ථිකයේ සංවර්ධනයට ද ගැලපෙන පරිදි ප්‍රධාන ප්‍රවේශයන් දෙකක් ඔස්සේ එය සකස් කළ හැකිය. අනුකූලතා මත පදනම් වූ ප්‍රවේශයේ දී, මූල්‍ය සේවා සපයන්නන් විසින් අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම කෙරෙහි අධීක්ෂකවරුන් අවධානය යොමු කරන අතර, එහිදී නීති හා රෙගුලාසිවලට පූර්ණ අනුකූලතාව සහතික කිරීම සඳහා සුදුසු බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ගනු ඇත. එසේ වුවද, අවදානම් මත පදනම් වූ ප්‍රවේශයේ දී අවදානම් විශ්ලේෂණය සහ අවදානම් අවම කිරීම් කෙරෙහි අධීක්ෂකවරුන් අවධානය යොමු කරයි. ඒ අනුව, අවදානම් මත පදනම් වූ ප්‍රවේශය වෙළෙඳපොළ හැසිරීම අධීක්ෂණයෙහි වඩා පූර්වගාමී ප්‍රවේශයක් ලෙස හඳුනාගත හැකි අතර එහිදී අධීක්ෂණ ක්‍රියාවලියට පෙර සහ අධීක්ෂණ චක්‍රය තුළ දී හඳුනාගත් අවදානම් මට්ටම් අනුව අධීක්ෂණ ක්‍රියාකාරකම් වඩා සූක්ෂම ලෙස සකස් කිරීම සිදුවේ.

### ප්‍රධාන අධීක්ෂණ මෙවලම්

වෙළෙඳපොළ හැසිරීම අධීක්ෂණය තුළ මාධ්‍ය නිරීක්ෂණ සහ මූල්‍ය සේවා සමාලෝචන, තේමාත්මක සමාලෝචන (Thematic Review), හදිසි වෙළෙඳපොළ සංචාර සහ ඇමතුම් (mystery shopping and calls), මෙන්ම මූල්‍ය සේවා සපයන්නන්ගේ ස්වයං තක්සේරු කිරීම සහ මූල්‍ය සේවා සපයන්නන්ගේ ඉහළ කළමනාකාරීත්වය සමග නියුතු වී කටයුතු කිරීම වැනි අධීක්ෂණ මෙවලම් මාලාවක් ඇතුළත් වේ. මෙම මෙවලම් වෙළෙඳපොළ හැසිරීම පිළිබඳ අවදානම් සහ එහිදී මතුවන ගැටලු පාලනය කිරීම සඳහා යම් භාවිතයන් සහ පාලන ක්‍රමවේදයන්වල ප්‍රමාණාත්මක බව නිර්ණය කිරීම සම්බන්ධයෙන් විශේෂ

1

අවධානයක් යොමු කරමින් යොදාගනු ලබන අතර, මෙමගින් ඵලදායී වෙළෙඳපොළ හැසිරීම අධීක්ෂණයක් සිදු කිරීම සඳහා අධීක්ෂකවරුන්හට පහසුකම් සලසා ඇත.

**මහ බැංකුවේ වෙළෙඳපොළ හැසිරීම් අධීක්ෂණ කාර්යය**

මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ නියාමනයන්හි ගෝලීය වශයෙන් සිදුවූ සංවර්ධනය අනුව යමින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2020 වසරේ දී මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව පිහිටුවන ලද අතර, මුදල් නීති පනතේ 10(ඇ) වගන්තිය යටතේ, 2023 වසරේ අගෝස්තු මස දී, 2023 අංක 01 දරන මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය පිළිබඳ රෙගුලාසි නිකුත් කරන ලදී. 2024 වසරේ අගෝස්තු මාසයේ සිට පූර්ණ වශයෙන් බලාත්මක වන මෙම රෙගුලාසි මගින්, විවිධ නීතිමය තත්ත්ව යටතේ මීට පෙර නිකුත් කර ඇති පාරිභෝගික ආරක්ෂණ රාමු ඒකාබද්ධ කිරීම සහ ශක්තිමත් කිරීම ද, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන මූල්‍ය සේවා සපයන්නන්ගේ වෙළෙඳපොළ හැසිරීම අධීක්ෂණය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත අවශ්‍ය බලතල ද ලබා දී ඇත.

මෙම රෙගුලාසි මගින් ලැබී ඇති බලතල ප්‍රකාරව, මූල්‍ය සේවා සපයන්නන්ගේ වාර්තා වී ඇති අනුකූලතා නොවීම් සහ අක්‍රමිකතා පිළිබඳව නිසි සැලකිල්ලක් දක්වමින් අවදානම් මත පදනම් වූ ප්‍රවේශයක් යටතේ වෙළෙඳපොළ හැසිරීම අධීක්ෂණය ආරම්භ කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව කටයුතු සකස් කර ඇත. වෙළෙඳපොළ හැසිරීම අධීක්ෂණයෙහි මුල් පියවරක් ලෙස, මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය සේවා සපයන්නන්ගේ පැමිණිලි හැසිරවීමේ යාන්ත්‍රණය පිළිබඳ තේමාත්මක සමාලෝචනයක් සිදු කර ඇති අතර, මෙමගින් මූල්‍ය සේවා සපයන්නන්හට ඔවුන්ගේ අභ්‍යන්තර පැමිණිලි හැසිරවීමේ යාන්ත්‍රණය වැඩිදියුණු කිරීමට අවස්ථාවක් සලසන ලද අතර ම, වෙළෙඳපොළ හැසිරීම අධීක්ෂණ ක්‍රියාවලිය සඳහා පසුබිම සැකසීමද මෙය උපකාරී වනු ඇත.

**සමාප්තිය සහ ඉදිරි දැක්ම**

නවීන මූල්‍ය නිපැයුම් සහ සේවාවන්හි පවතින වැඩි අවදානම් සහ සංකීර්ණතා සමඟ සෑම රටක් ම ගමන් කරන තත්ත්වයක් තුළ මූල්‍ය අන්තර්ගතභාවය සහ පද්ධති ස්ථායිතාව සාක්ෂාත් කර ගැනීමේ ප්‍රධාන අංගයක් ලෙස මූල්‍ය පද්ධතිය කෙරෙහි මහජන විශ්වාසය තහවුරු කිරීම සැලකිය හැක. ශක්තිමත් වෙළෙඳපොළ හැසිරීම අධීක්ෂණය මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය නියාමනය කිරීමේ ප්‍රධාන යාන්ත්‍රණය ලෙස කටයුතු කරන අතර, නිරන්තරයෙන් ම මූල්‍ය පාරිභෝගිකයින්ට සාධාරණ ලෙස සැලකීම සහ මූල්‍ය සේවා සපයන්නන්ගේ වගකීම් සහගත වෙළෙඳපොළ හැසිරීම තවදුරටත් ශක්තිමත් කරනු ලබන අතර, මෙමගින් සමස්ත මූල්‍ය පද්ධතිය කෙරෙහි මහජන විශ්වාසය වැඩි කිරීමට මග පෑදේ.

මේ සම්බන්ධයෙන්, මූල්‍ය සේවා සපයන්නන්ගේ වෙළෙඳපොළ හැසිරීම අධීක්ෂණය සිදු කිරීම සඳහා අවශ්‍ය යාන්ත්‍රණ, නිපුණතා සහ ක්‍රියා පටිපාටි ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2023 අංක 01 දරන මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසිවලට අනුව සංවර්ධනය කරමින් පවතී. වර්තමානයේ, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එහි අධීක්ෂණ ප්‍රවේශය, මෙවලම් සහ ඒ සම්බන්ධ සියලු අවශ්‍ය විස්තර සහිතව ඒකාබද්ධ වෙළෙඳපොළ හැසිරීම් අධීක්ෂණ අත්පොතක් සකස් කර ඇති අතර 2024 වසරේ දෙවන භාගයේ දී සම්පූර්ණ විෂය පථයකින් සමන්විත පළමු වෙළෙඳපොළ හැසිරීම අධීක්ෂණය ආරම්භ කිරීමට අපේක්ෂා කර ඇත. ඉදිරියේ දී, මූල්‍ය පාරිභෝගිකයින්ගේ විශ්වාසය තහවුරු කරමින් වඩාත් ශක්තිමත් සහ ස්ථාවර මූල්‍ය පද්ධතියකට දායක වීමේ අරමුණින් වෙළෙඳපොළ හැසිරීම අධීක්ෂණය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පළපුරුද්ද සහ ප්‍රවීණත්වය ලබා ගැනීම සඳහා අනෙකුත් රටවල වෙළෙඳපොළ හැසිරීම් අධීක්ෂකවරුන් සහ මූල්‍ය අන්තර්ගතභාවය සඳහා වූ සන්ධානය (AFI) සහ ජාත්‍යන්තර මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ සංවිධානය (FinCoNet) වැනි ජාත්‍යන්තර සංවිධාන වෙතින් වැඩි සහයෝගයක් ලබා ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුව අපේක්ෂා කරනු ලබයි.

මූලාශ්‍ර
1. An Introduction to Developing a Risk-Based Approach to Financial Consumer Protection Supervision (2022) - World Bank
2. Establishing a Financial Consumer Protection Supervision Department (2021) – World Bank
3. Financial Consumer Protection and New Forms of Data Processing Beyond Credit Reporting (2018) – World Bank
4. Good Practices for Financial Consumer Protection (2017) – World Bank
5. Market Conduct Supervision in Small Countries: The Case of Armenia (2013) – World Bank
6. Market Conduct Supervision of Financial Services Providers A Risk-Based Supervision Framework (2016) - Alliance for Financial Inclusion
7. Market Conduct Supervision – A Toolkit (2023) - Alliance for Financial Inclusion
8. The Global State of Financial Inclusion and Consumer Protection (2022) - World Bank